## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

### - 10 ශ්‍රේණිය

(10 ශ්‍රේණියේ දෙවන වාරයේ කාලච්ඡේද 18 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **10 ශ්‍රේණිය දෙවන වාරය සඳහා තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 10.3.2 සදිසා නමස්කාරය ඇසුරින් තම යුතුකම් හැඳින සමාජ යුතුකම් ඉටු කිරීමට ක්‍රියා කරය | • සදිසාවෙන් දැක්වෙන සාරධර්ම පැහැදිලි කරයි.<br>• තම යුතුකම් ඉටුකිරීමට සැලකිලිමත් වෙයි.<br>• සදිසාවන්හි දැක්වෙන යුතුකම් "ඊ" සටහනකින් නිරූපණය කරයි.<br>• සමාජ සබඳතාවල දී සහකම්පනයෙන් කටයුතු කරයි.<br>• යහපත් සමාජ සබඳතා ගොඩනගා ගනියි. | ■ සදිසා නමස්කාරය (සිගාලෝවාද සූත්‍රය) | | 9 සබඳතා රකින මිනිස් යුතුකම් | 03 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි | 10.5.1 බුදු දහමෙන් ගොඩනගා ගත් අනන්‍යතාව දෛනික ජීවිතයේ දී ප්‍රදර්ශනය කරයි. | • චාරිත්‍ර වාරිත්‍ර පැහැදිලි කරයි.<br>• ආපදාපන්න අවස්ථාවල දී සහයෝගයෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• පොදු දේපොළ සුරැකීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග ලැයිස්තු ගත කරයි.<br>• අන්‍යාගමික මතවලට ද ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.<br>• පොදු මතයන්ට ගරු කරමින් දැහැමි ජීවිතයක් ගත කරයි. | අන්‍යාගමික ඇසුර පැවැත්විය යුතු අයුරු, දැහැමි රැකියා, අවුරුදු චාරිත්‍ර, ආපදාපන්න අවස්ථාවන්හි දී කටයුතු කිරීම, පොදු දේපල පරිහරණය | | 11 අපේ කම හා සහජීවනය | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගත ය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 10.6.1 කර්මය හා කර්ම විපාක පිළිබඳ නිවැරදි දැක්මෙන් කට යුතු කරයි. | • කර්මය, කර්මයේ ප්‍රභේද හා එහි විපාක සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>• කර්මය දෙලොව දීම විපාක දෙන බව පිළිගනයි.<br>• කර්මයේ ප්‍රභේද ගැලීම් සටහනකින් දක්වයි.<br>• කිසියම් ක්‍රියාවක් සිදු කිරීමේ දී හොඳ නරක පිළිබඳ සැලකිලිමත් වෙයි. | කර්මය, කර්මයේ ප්‍රභේද, කර්ම විපාක | | 12 කර්මය සහ එහි ප්‍රභේද හැඳිනගනිමු. | 03 |
| 6.0 බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 10.6.2 ත්‍රිලක්ෂණ ධර්මතාව හැඳින යථාවබෝධයෙන් කටයුතු කරයි. | • ත්‍රිලක්ෂණ ධර්මතාව හැඳින පැහැදිලි කරයි.<br>• ත්‍රිලක්ෂණය ලොව පවතින සියලු ධර්මතාවලට පොදු වූවක් බව පිළිගනියි.<br>• අනිත්‍යතාව ප්‍රකට වන කතා පුවතක් ගොඩ නගයි.<br>• වෙනස් වීමට ඔරොත්තු දීමේ ශක්තිය ප්‍රදර්ශනය කරයි.<br>• අකම්පිත ව යථාර්ථයට මුහුණ දෙයි | ත්‍රිලක්ෂණය | | 13 ඇති තතු කියන තිලකුණු දහම | 03 |
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 10.6.3 පටිච්ච සමුප්පාද න්‍යාය ගැටලු නිරාකරණයට භාවිත කරයි. | • පටිච්ච සමුප්පාද න්‍යාය දැක්වෙන මූල සූත්‍රයේ අදහස පැහැදිලි කරයි.<br>• සියලු ම දේ හේතුඵල සම්බන්ධතාවෙන් හටගන්නා බව පිළිගනියි<br>• මූල සූත්‍රය හා "යේ ධම්මා හේතුප්පභවා ........" යන ගාථාව මතකයෙන් කියයි.<br>• ගැටලු නිරාකරණයේ දී එහි හේතුඵල සම්බන්ධතාව සොයා බලයි.<br>• පොදු ගැටලු අධ්‍යයනය කොට අන් අයට නිවැරදි ව මග පෙන්වයි | පටිච්ච සමුප්පාද මූල සූත්‍රය '' ඉමස්මිං සති ඉදං හෝති'' පාඨය සහ '' යෙ ධම්මා හේතුප්පභවා '' ගාථාව | | 14 පටිච්ච සමුප්පාද න්‍යාය හැඳින ගනිමු | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 6.0<br>බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 10.6.4<br>ආර්ය සත්‍ය හතර නිවැරදි ව හැඳින හරවත් ජීවිතයක් ගත කරයි. | • උතුම් ආර්ය සත්‍ය හතර පිළිබඳ පැහැදිලි විග්‍රහයක් කරයි.<br>• දුක හට ගැනීමට හේතුව සමුදය සත්‍යයෙන් ප්‍රකට වන බව පිළිගනියි.<br>• දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයට අයත් මධ්‍යම ප්‍රතිපදාව පිළිවෙළින් ලියා දක්වයි.<br>• විශ්ලේෂණාත්මක ව ගැටලු විසඳා ගනියි..<br>• ජීවිත අවබෝධයෙන් යුතු ව කටයුතු කරය | චතුරාර්ය සත්‍යය සමාලෝචනය | | 15 සිව්සස් හැඳින සැනසුම ලබමු | 03 |
| | | | | | | |
| එකතුව | | | | | | 18 |